# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට මෙන්ම ආසියා පැසිපික් කලාපයේ ප්‍රමුඛ පෙළේ දැවැන්ත බැංකු 500 අතරට ශ්‍රේණිගතව ඇති සහ ශ්‍රී ලංකාව තුළ රජයට අයත් අංක 1 අග්‍රගණ්‍ය බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් ඇති උද්යෝගිමත් සහ ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් ලංකා බැංකුවේ නීති අංශය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී උසාවි ලිපිකරු / අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරු

### යෝග්‍යතා නිර්ණායක

- ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- අ.පො.ස (සා/ පෙළ) විභාගයෙන් එක් වරකදී ගණිතය, ඉංග්‍රීසි භාෂාව සහ මවුබස (සිංහල/ දෙමළ) ඇතුලුව සම්මාන සාමාර්ථ 5 ක් සහිතව සමත් වී තිබීම (අතිරේක විෂයයන් හැර)

**සහ**

- අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 3 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) සමත් වී තිබීම.

**සහ**

- නීතිඥ සමාගමක හෝ නීතිඥයෙකු යටතේ උසාවි ලිපිකරුවකු/ නොතාරිස් ලිපිකරුවකු වශයෙන් වසර 2 ක පළපුරුද්ද.

**වෙනත් සුදුසුකම්**

- යතුරු ලිවීමේ වේගය විනාඩියට වචන 20 (ඉංග්‍රීසි සහ සිංහල හෝ දෙමළ)
- පරිගණක සාක්ෂරතාවය සහ ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍යයි.

**වයස**

- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයට අවුරුදු 35 හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් සහ කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර,එම කාලසීමාව තුළදී මාසික දීමනාවක් (පළමු වසර සඳහා මසකට රු. 45,000/- ක් ද, දෙවන වසර සඳහා මසකට රු. 60,000/- ක් ද) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- පුහුණු කාලය තුළදී බැංකුව විසින් අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා සපුරාලීම මත උසාවි ලිපිකරු - I/ නොතාරිස් ලිපිකරු -I ශ්‍රේණියේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කෙරේ.
- කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත/ නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

### තෝරා ගැනීමේ පටිපාටිය

- තරඟ විභාගයකින් (ලිඛිත පරීක්ෂණය සහ යතුරු ලියන වේගය පිළිබඳ පරීක්ෂණය) අනතුරුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.
- තරඟ විභාගයේදී ලබාගත් ලකුණු, සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("Careers" තීරය හරහා) ලබාගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සැකසූ ඔබගේ අයදුම්පත, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, සියලු අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2022.08.13 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර සඳහන් කළ යුතුය.

*අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ ලේඛනවල ඡායාස්ථ පිටපත් ඇතුළත් කර නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව බඳවා ගැනීමේ පටිපාටියේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් සහ වෘත්තීය සංවර්ධන),**
**මානව සම්පත් අංශය, 26 වන මහල,**
**ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,**
**ලංකා බැංකු චතුරශ්‍රය,**
**අංක 01, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

*ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් වහාම නුසුදුස්සකු කිරීමට හේතු වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ. සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ /අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුවේ.*

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ